පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : - ගණිතය

7 ශ්‍රේණිය

සතිය- 3 වාරය 08 සතිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## 24 ඒකකය - සරල රේඛීය තල රූප නිර්මාණය(2)

- **සමපාද ත්‍රිකෝණ නිර්මාණය කිරීම**

ාදයක දිග 3 cmක් වූ සමපාද ත්‍රිකෝණයක් නිර්මාණය කරමු.

පියවර 1 - කවකටුව සහ කෝදුව භාවිතයෙන් 3 cmක් වූ *AB* සරල රේඛා ඛණ්ඩය නිර්මාණය කරන්න.




පියවර 2 - කවකටුවේ තුඩ සහ පැන්සල් තුඩ අතර දුර 3 cmක් වන පරිදි කවකටුව සකසා ගන්න. කවකටුවේ තුඩ *A* ලක්ෂ්‍යය මත තබා රූපයේ දැක්වෙන පරිදි පැන්සල් තුඩින් චාපයක් අඳින්න.




පියවර 3 - ඊළඟට කවකටුවේ සැකැස්ම වෙනස් නොකර කවකටුවේ තුඩ *B* මත තබා පළමු චාපය ඡේදනය වන පරිදි තවත් චාපයක් අඳින්න. චාප ඡේදනය නොවේ නම්, *A* මත කවකටුවේ තුඩ තබා පළමු චාපය විශාල කර ගන්න. එම චාප ඡේදනය වන ලක්ෂ්‍යය *C* ලෙස නම් කරන්න.




පියවර 4 - *AC* හා *BC* යා කරන්න.




එවිට පාදයක දිග 3 cm වූ *ABC* සමපාද ත්‍රිකෝණය ලැබේ.

- පහත දැක්වෙන දිග සහිත පාද ඇති සමපාද ත්‍රිකෝණ නිර්මාණය කරන්න.

i 5 cm ii 8 cm iii 3.5 cm iv 6.5 cm v 4 cm